www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: යුද සරනගතයන් දැවැන්ත "සුභසාධක කඳවුරුවල" රඳවා තැබීමට යයි

## Sri Lanka: war refugees to be detained in huge "welfare camps"

**සම්පත් පෙරේරා විසිනි**
**2009 පෙබරවාරි 20**

රටේ දෙමල ජනතාව "මුදාගැනීමට" යුද්ධයක් ගෙන යන බවට එය කරන කියාපෑම් කෙසේවෙතත්, කොලඹ ශ්‍රී ලංකා ආන්ඩුව, හමුදාව සහ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර යුද්ධයට මේ දැන් හසුව සිටින 200,000ක් පමන වන දෙමල සිවිල් වැසියන් පදිංචි කරවීමට රැඳවුම් මධ්‍යස්ථාන තැනීමේ සැලසුම් සකස් කර ඇත.

ඊසානදිග මුලතිව් දිස්ත්‍රික්කය තුල එල්ටීටීඊ පාලනය යටතේ ඉතිරිව පවතින කුඩා භූමි ප්‍රදේශය තුල මිලියන කාර්තුවක පමන සිවිල් ජනතාවක් කොටු වී ඇතැයි ආධාර ඒජන්සි තක්සේරු කරයි. ඔවුන්ගෙන් බොහොමයකට ආහාර, පිරිසිදු ජලය, හිසට සෙවනක් හා වෛද්‍ය පහසුකම් ඇතුලු මූලික අවශ්‍යතාවන්ට ප්‍රවිෂ්ටයක් නැත. මෙම ප්‍රදේශය මිලිටරිය විසින් ඉවබවක් නැතිව කාලතුවක්කු හා ගුවන් ප්‍රහාරවලට නතු කර තිබෙන්නේ, සිය ගනනින් මියයාමට හා තවත් බොහෝ සංඛ්‍යාවකට තුවාල සිදුවීමට තුඩු දෙමිනි.

පලා ඒමට සමත්ව ඇති අය, "සුභසාධක කඳවුරුවලට" යැවීමට පෙරාතුව, ආරක්ෂක හමුදා විසින් උතුරේ යුද කලාපයට ආසන්න අතරමැදි කඳවුරුවල රඳවා ගැනේ. ඉතිරිව සිටින සරනගතයන් සියල්ලම රඳවා ගත හැකි වන පරිදි කඳවුරු පුලුල් කිරීමේ සැලසුමක් දැන් ආධාර ඒජන්සි හා කොලඹ තානාපති නිලධාරින් අතර බෙදා හැර ඇත්තේ, ජාත්‍යන්තර පිටුබලය හා මුදල් ආධාර සහතික කරගැනීමේ ප්‍රයත්නයක් ලෙසය.

ජනාධිපති කාර්යාලය විසින් පිලියෙල කරන ලද සැලසුමේ විස්තර, එහි ඇඟවුම් මගින් පැහැදිලිවම කනස්සල්ලට පත්ව ඇති ආධාර ඒජන්සි දෙකක් විසින්, *ඇසෝසියේටඩ් ප්‍රෙස්* ප්‍රවෘත්ති සේවය වෙත කාන්දු කරනු ලැබ තිබේ. ඊයේ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සැලසුමේ පිටපතක් ලබාගැනීම හා ඔහුගේ අදහස් දැනගනු පිනිස, අදාල විෂය භාර අමාත්‍යංශයේ ලේකම් රජීව විජේසිංහ සම්බන්ධ කරගැනීමට නැවතනැවතත් උත්සාහ කල නමුත් ඔහු දිගටම "සිටියේ නැත".

යථා වසයෙන් ගත් කල, සුභසාධක කඳවුරු නැතහොත් ගම්මාන දැවැන්ත සිර කඳවුරු වනු ඇත. පවුල් 40,000 සිට 50,000 අතර සංඛ්‍යාවක් නැතහොත් පුද්ගලයන් 200,000ක් පදිංචි කරවීමට කඳවුරු පහක් ගොඩනැගීමට නියමිතය. ඉන් හතරක් වවුනියාව නගරය අසල ද එකක් වයඹ වෙරලේ මන්නාරමේ ද පිහිටුවීමට සැලසුම් කෙරෙයි. තමන් කඳවුරකට යවනු ලැබේ ද නැද්ද යන්න තෝරාගැනීමේ අයිතිය සරනගතයන්ට නොලැබෙනු ඇත. ඔවුන්ට නිදහසේ ඉන් පිටවයාමට ද නොහැකි ය. වත්මන් සැලසුම වන්නේ, සරනගතයන් මෙම රැඳවුම් මධ්‍යස්ථානවල වසර තුනක් දක්වා කාලයකට රඳවා තැබීමයි.

අවශ්‍ය සියලු දේවල් මෙම කඳවුරු තුලම අඩංගු වනු ඇත. එක් එක් ගම්මානය අර්ධ-නිත්‍ය නිවාස 39,000කින්, වැසිකිලි 7,800කින් හා මලපවාහන ටැංකි 780කින් මෙන් ම උද්‍යාන, තැපැල් කාර්යාල, බැංකු, වෙලඳ සැල් හා ප්‍රජා මධ්‍යස්ථාන 390කින් සමන්විත වනු ඇත. 86,000කට අධික සිසුන් සංඛ්‍යාවක් වෙනුවෙන් පාසල් 40ක් ද සැලසුම් කෙරෙයි.

වැඩෙන ජාත්‍යන්තර විවේචන ගැන දැනුවත්ව, ආන්ඩුවේ ඇමතිවරු හා නිලධාරිහු, තමන් උත්සුක වී ඇත්තේ සරනගතයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය ගැන පමනක් යයි කියාපෑහ. "ගම්මාන සිවිල් නිලධාරින් විසින් පාලනය කරනු ඇති" බවත් කිසිවෙකුට හෝ අකාලයේ යලි පදිංචිවීමට බල නොකෙරෙනු ඇති බවත් ආපදා කලමනාකරන හා මානව හිමිකම් අමාත්‍ය මහින්ද සමරසිංහ මාධ්‍යවලට සහතික විය.

කෙසේවෙතත්, සමරසිංහගේ අමාත්‍යංශ ලේකම් රජීව විජේසිංහ පැහැදිලි කලේ, කඳවුරු පාලනය කිරීමෙහිලා මිලිටරිය "විශාල ලෙස මැදිහත් වනු" ඇති බවයි. හමුදාව සරගතයන් පරීක්ෂා කිරීමට මැදිහත් වනු ඇත. එහිදී එම සරනගතයන් මුහුන දෙන්නේ එල්ටීටීඊ සැකකරුවන් ලෙස චෝදනා නොමැතිව දින නියමයක් නැතිව සිරගත වීමේ අන්තරායටයි. ලන්ඩන්-පාදක *ටයිම්ස්* සඟරාවට කතා කරමින් විජේසිංහ මෙසේ පැවසීය: "ඇත්ත වසයෙන්ම එය ස්වේච්ඡාවෙන් සිදු නොවනු ඇත. සෑම කෙනෙක්ම පරීක්ෂා කිරීමට අපට අවශ්‍යය. මේක සිවිල් ජනතාව විනිවිද ඇති ත්‍රස්තවාදීන් සමග අප කටයුතු කරන අවස්ථාවක්. ආරක්ෂාව හැම දේටම වඩා ඉහලින් තියන්න සිදු වෙනවා."

දෙසැම්බරයේ දී එක්සත් ජනපද-පාදක හියුමන් රයිට්ස් වොච් (එච්ආර්ඩබ්ලිව්) සංවිධානය විසින් නිකුත් කරන ලද වාර්තාවක්, දැනට පවතින කඳවුරු රැඳවුම් මධ්‍යස්ථාන ලෙස යොදා ගැනෙන බවට උත්සුකතා මතු කලේය. මාධ්‍යවලට හා මානව හිමිකම් කන්ඩායම්වලට ඒවා තහනම් කර ඇතැයි එච්ආර්ඩබ්ලිව් පැවසීය. කිසිවෙකුට හෝ නිදහසේ යාමට හා ඒමට අවසර නැත. ඉන් පිටව යන අයට අවසර පත්‍රයක් ද ප්‍රානඇපකරුවකු ලෙස එහි රැඳී සිටිය යුතු ඥාතියෙක් ද අවශ්‍යය. එම කඳවුරු කටුකම්බි වැටවලින් වට කරන ලදුව විශාල මිලිටරි භටයන් සංඛ්‍යාවක් එහි යොදවා තිබේ.

අවුරුදු පහට වඩා අඩු වයසේ පසුවන 39ක් ඇතුලු 450ක් දැනට රඳවා ඇති මන්නාරම දිස්ත්‍රික්කයේ කඳවුරක නිවැසියන් සමග *ටයිම්ස් සඟරාව* මේ සතියේ කතා කලේය. නිවාස තාවකාලිකව අටවන ලද ඒවාය. කඳවුර වටා කටුකම්බි ගසා තිබූ අතර සොල්දාදුවෝ අඛන්ඩව එය මුර කලහ. ලිපිය පැහැදිලි කල පරිදි, එච්ආර්ඩබ්ලිව් හා සෙසු ජාත්‍යන්තර සංවිධාන කඳවුරු විවෘතව තැබිය යුතු බවට බල කරමින් සිටී. ඒ වෙනුවට, ජනවාරි 10 දා, ආන්ඩුව ඒවා “අධි ආරක්ෂිත කලාප” බවට පත් කොට, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අන්තර්ජාතික රතු කුරුස කමිටුව හැරුනු කොට අන් සියල්ලන්ටම ඒවා තහනම් ප්‍රදේශ බවට පත් කලේය.

තමන්ට කඳවුරුවල වාසය කිරීමට අවශ්‍ය නැති බව බොහෝ දෙනෙක් *ටයිම්ස් සඟරාවට* පැවසීය. තමන් සතුව අදාල ලියකියවිලි ඇති බවත් තමන්ව භාර ගැනීමට කැමති පවුල් සිටින බවත් තමන්ගේ යැපීමට ප්‍රමානවත් මුදල් ද තමන් සතුව ඇති බවත් ඔවුහු පැහැදිලි කලහ. “මේ හැම දෙයක්ම අපි හමුදාපතිට කිව්වා” යයි එක් රැඳවියෙක් පැවසීය. තමන් නිදහස් කරන ලෙස ඉල්ලා ලියා ඇති ලිපි සංඛ්‍යාව මතක් කර ගැනීමටත් අපහසු බව ඔහු විස්තර කලේය. “මට පිස්සු හැදෙන්න යනවා වගේ දැනෙනවා. මට කියන්න අවශ්‍ය අපි කිසිම හේතුවක් නැතිව තියාගෙන ඉන්නවා කියලයි.”

දකුනු ආසියාව සමග සබඳතා පිලිබඳ යුරෝපා පාර්ලිමේන්තු නියෝජිත කන්ඩායමේ සභාපති ලෙස ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනු බ්‍රිතාන්‍ය ලේබර් දේශපාලනඥයකු වන රොබර්ට් එවන්ස් ලන්ඩනයේ *ටයිම්ස් සඟරාවට* මෙසේ පැවසීය: “මේවා සුභසාධක කඳවුරු නෙවි. ඒවා යුද සිරකරුවන්ගේ හා රැඳවුම්කරුවන්ගේ කඳවුරු.” බ්‍රිතාන්‍යයේ ජාත්‍යන්තර සංවර්ධන දෙපාර්තමේන්තුව පරෙස්සම් සහගතව මෙසේ ප්‍රකාශ කලේය: “වත්මන් සැලසුම් ජාත්‍යන්තර මානුෂ්‍ය සම්මතයන්ට අනුව ප්‍රමානවත් විසඳුමක් නියෝජනය කරන බවට අපි විශ්වාස නොකරමු.”

විවේචන පාලනය කරගැනීමේ උත්සාහයක් ලෙස, ආන්ඩුව කියාපෑවේ සරනගතයන්ගෙන් සියයට 80ක් 2009 අග වන විට යලි පදිංචි කරවන පරිදි සිය සැලසුම වැඩිදියුනු කර ඇති බවයි. එය හිස් පොරොන්දුවකි. නැගෙනහිර “මුදාගත්” බව ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රකාශයට පත් කොට මාස 18කටත් වැඩි කලකට පසුව, යුද්ධය නිසා අවතැන් වූ පවුල් 60,058ක් මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවල තාවකාලික කඳවුරු 15ක තවමත් රැඳී සිටින බව, අඟහරුවාදා පාර්ලිමේන්තුවේ කතා කරමින්, ආන්ඩුවේ ප්‍රධාන සංවිධායක දිනේශ් ගුනවර්ධන පිලිගත්තේය.

යුද සරනගතයන් ලාභ ශ්‍රමය ලෙස සූරාකෑම පිනිස ව්‍යාපාරික නායකයෝ දැනටමත් සැලසුම් සකස් කරමින් සිටිති. ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදයේ ලේකම් රොහාන් මාසකෝරාල පෙබරවාරි 15 දා *රාවය* පත්‍රයට කියා සිටියේ, සිය සාමාජිකයන් “යුද ජයග්‍රහන දෙස බොහොම සුබවාදීව බලා සිටින” බවයි. ඔහු තව දුරටත් මෙසේ පැවසීය: “එය අපගේ ව්‍යාපාරික කටයුතුවලට සහ සමස්ත ආර්ථිකයටම ඉතාමත් වාසිදායක තත්වයක් වන නිසා, භූමිය, ජනතාව සහ පාලන බලය අත්පත් කරගැනීම සෑමවිටම ප්‍රාග්ධන ආයෝජනයන් සඳහා අතිශය ධනාත්මක තත්වයක් උදාකර දෙනවා.

“දකුනේ ආයෝජනය කරනවාට වඩා උතුරේ සහ නැගෙනහිර ආයෝජනය කිරීම මගින් ශ්‍රමය අඩු මිලට මිලදී ගැනීමට හැකියාව ලැබෙන නිසා මෙම ප්‍රදේශවල ඇඟලුම් කර්මාන්තශාලා ඇරඹීම ඉතා වාසිදායකයි. අපි රජයට යෝජනා කර සිටිනවා උතුර සහ නැගෙනහිර නිදහස් ආර්ථික කලාප පිහිටුවන ලෙසට. එවිට මෙම තත්වයෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම තවත් පහසු වේවි.”

© www.wsws.org